**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி cau; கல்வி kw;Wk; njhopw; கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (cau; தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv.Level) Examination, 2025

සිංහල **I**
சிங்களம் **I**
Sinhala **I**

**71** | **S** | **I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්:**

❖ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** හා **(උ)** යන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** දැන් තොපි දඹදිව්තෙලෙහි ඇවිද තොප හා වාද කරන්ට සමර්ථ කෙනෙකුන් බලව'යි උන් අතට දඹ අත්තක් දීලා 'පරිව්‍රාජිකාවෙනි, යව'යි අවසර දී කියන්නෝ 'ඉදින් ගිහි කෙනෙක් තොප හා වාද කටහුණුවු නම් උන්ට පාදපරිචාරිකා වව. ඉදින් පැවිදි කෙනෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ළඟ මහණ වව'යි උගන්වා යවූ ය.

උයිත් දඹ අත්ත අතින් ගෙන ඇවිදිනා හෙයින් ජම්බුපරිව්‍රාජිකා නම් ව එයින් නික්ම දුටු දුටු කෙනෙකුන් හා වාද කෙරෙමින් ඇවිදිති. උන් හා වාද කටහෙන කෙනෙක් සම්භ නුවූ ය. ඒ ඒ තැන මිනිස්සු ජම්බුපරිව්‍රාජිකාවෝ එති බසක් ඇසූ කල ම උන්ගේ නමට ම දුරබා පලා යෙති. ඌ තුමූ ගමකට හෝ නියම්ගමකට හෝ සිඟා වදනා කල ගම්දොර එක් තැනක වැලි රැසක් කොටලා අත්ත ඊ හිඳුවාලා 'මා හා වාද කටහෙන කෙනකුන් දඹ අත්ත මිරිකන බව ය'යි කියාලා ගමට සිඟා වදිති. වාද තබා දඹ අත්ත ළඟටත් යාහෙන්නෝ නැත. පරිව්‍රාජිකාවෝ ද ඒ අත්ත මලානික වූ කල අනික් දඹ අත්තක් හැර ගනිති.

මෙලෙස ම කොට ඇවිදිනෝ සැවැත් නුවරට ගොසින් නුවර වාසල කෙරේ දඹ අත්ත සිටුවාලා ආදි ලෙස ම සම්මතයක් කොටලා සිඟා නුවරට වන්නු ය.

(i) පරිව්‍රාජිකාව ගමට සිඟා වදින්නට පෙර ගම් දොර දඹ අත්තක් සිටුවා යාමේ අරමුණ කුමක් ද?

(ii) පරිව්‍රාජිකාවරුන් වාද දහස ඉගැන්වීමෙන් අනතුරු ව ජම්බුපරිව්‍රාජිකාවට දුන් උපදෙස් මොනවා ද?

(iii) " ඒ ඒ තැන මිනිස්සු ජම්බුපරිව්‍රාජිකාවෝ එති බසක් ඇසූ කලට උන්ගේ නමට ම දුර බා පලා යෙති ". මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) **' සම්මතයක් '** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ආ)** "එම්බා නැඟිණියෙනි, මාගේ ගෙහිමියාණෝ ඒකාන්තයෙන් ම නැත්නම් එදවස් දන්නෙම් වේ දැ" යි කියා කෙල්ල ආපස්සේ නික්මවූහ. ඔයිත් ගොසින් ඒ සියලු ම පවත් තමාගේ අමාත්‍යපුත්‍රයාට කිව්; අමාත්‍ය පුත්‍රයා එපවත් අසා "ඒකාන්තයෙන් මූ තමන්ගේ ගෙහිමියාණන් මළහොත් මා හා සමඟ

වාසයට ලැබෙන්නී ම ය" යි සිතා වෙළෙඳාණන් මරන්ට සිතනුයේ බොහෝ යකැදුරන් ගෙන්වා ගෙන "මේ උන්නාවූ තොප ඇම දෙනා අතුරෙන් පරදේශයට ගිය මිනිසුන් මරන්ට කවරෙක් සමර්ථ දැ" යි විචාළේ ය; එබසට සෙස්සෝ නොදනුම්හ යි කීහ; එයින් එක් යකැදුරෙක් පුළුවනැ යි කියා මධ්‍යම රාත්‍රියෙහි ඊට සුදුසු බලිබිලි ගෙන්වා ගෙන අමාත්‍යයා හා සමඟ ප්‍රේත පිශාච යක්ෂ රාක්ෂසයන් විසින් ගහන වූ ගිනි ඇවිළෙන සියගණන් දරසෑ ඇති ඒ ඒ තැන දවාගත නොහී දමන ලද සිය ගණන් මළ මිනි ඇති මහවටුවේ සොහොන්පොළට ගොස් කැණහිල් බලු කවුඩු කබරගොයි ආදින් විසින් කා කඩ නොකරන ලද ශරීරබන්ධන ඇති මළ මිනියක් දැක එතැන්හි බලිබිලි පුදා අමාත්‍යයා තමා පිටිපස්සේ ඉන්ට සලස්වා මන්ත්‍රයක් ජපනය කොට අතින් පැන් පතක් ගෙන මළමිනියට ගැසී ය;

(i) අමාත්‍ය පුත්‍රයා වෙළෙඳාණන් නසන්නට තීරණය කළේ කවර ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන් ද?
(ii) යකැදුරා මහවටුවේ සොහොන්පොළෙන් සොයා ගත් මළසිරුරේ ස්වරූපය කෙබඳු ද?
(iii) 'ප්‍රේත පිශාච යක්ෂ රාක්ෂසයන් විසින් ගහන වූ' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'බලිබිලි'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

**(ඉ)** මෙසේ සීසානා ගොවියක්හු විසින් පළමුව පලා ගොස් කුඹුරෙහි වනඅත් ගසා ඇළමං පායා ගෙන දෙවනුව ශුභ වූ නකතකින් ගෙවඩා බිම්නඟා දෙසී තුන්සී සා මියර කපා කැට තළා පෝරු ගා බිජුවට වඩා විධි වූ පරිද්දෙන් කුඹුරෙහි වපුටගත මැනව. ඒ වපුළා වූ කුඹුරෙහි සතාසතුන් සතියක් රැක්ක මැනව. වැට බැඳ ඉස්නන් නමා එගොයම් නිලන අවස්ථාවෙහි කුඹුර මැද රකවල් පැලක් තබාගෙන මැසිදඬක් ලාගෙන ගෙයිදී කන බතෙක රස නොදැන ඇදෙක පිටක් නො තබා රාත්‍රිදිවාභාගයෙහි එක දවසෙකත් නින්දේ නින්දක් නිදා නො පියා ගෙරින් මීවුන් ඌරන් මුවන් ආදි වූ සතාසතුන් සාරමසක් රැක්ක මැනව. කරලක් නැඟූ තෙන පටන්ගෙන පියන්වා ආදි වූ නොයෙක් රෝගයට කෙම්පාන් කමසේ නැතිව කළ මැනව. දවසින් දවසට කුඹුර සිසාරා අතු තබාලුව මැනව. පන් ඇද්ද මැනව. මෙසේ දුක්ගෙන ගොයම් රකිනා කල සීනටිකුඹුරෙක් වී නම් තුන්සාරමසක් රැක්ක මැනව. මාවී කුඹුරෙක් වී නම් සමසක් සත්මසක් රැක්ක මැනව.

(i) මා වී කුඹුරක් රැක බලා ගත යුතු කාල සීමාව කොපමණ ද?
(ii) සීසාන ගොවියන් පළමුව කළ යුතු කාර්යය කුමක් ද?
(iii) 'එගොයම් නිලන අවස්ථාවෙහි කුඹුර මැද රකවල් පැලක් තබා ගෙන' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'කෙම්පාන්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

**(ඊ)** එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය සුවාසූ දහසක් යොදුන් උඩ නැඟී සක් දෙව් රජහුගේ භවනය හුණු කෙළේය. ශක්‍ර දේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහ බෝසතාණන් ඔත් ගල් මුදුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහ බෝසතාණන් ඇඟ ඉස ලූහ. එකෙණෙහි විෂ නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය. මහ බෝසත් එවිට අනුන් වෙහෙසන්නට මළ වෙස් ලා වැදහොත් එකකු පරිද්දෙන් වහා නැගී සිට සුවපත් වූයේය. චන්ද්‍රාව ද එසඳ සුවපත් ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත් වූ සොම්නසට පැමිණ "ස්වාමීනි, යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා ඉස නිදුක් කොට මාගේ එකලාකම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද එසේ වූ නුඹ වහන්සේගේ ශ්‍රී පාදයට වඳිමි" වැදහොත්තී ය. ඒ ශක්‍ර දේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ "මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව" යි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

(i) මේ පාඨයේ ඇතුළත් උපමාව උපුටා දක්වන්න.
(ii) කිඳුරාට සහ කිඳුරියට සක් දෙවිඳුන් දුන් උපදෙස කුමක් ද?
(iii) 'එකෙණෙහි විෂ නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය.' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'එකලාකම්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

**(උ)**

ක න් කලු වෙණ නද ඇසුමෙහි ලො බි නේ
ර න් රසු දැල් කොලහල වන බි යෙ නේ
ස න් සල නො ව එහි පිළිරු ලෙ සි නේ
න න් හය සෙන් සිටියෝ සිටි ම ති නේ

නි ති නිරිඳුගෙ රැකවලෙහි නි යු ත් තෝ
රු ති ලෙස රුපුනොද බිඳ ජය ග ත් තෝ
පැ ති රෙන වෙණ නද බැඳුණු සි තැ ත් තෝ
අ ති න'වි ගිලිහෙන බව නොම ද ත් තෝ

(i) ආරක්ෂකයන් අතින් අවි ගිලිහීමට හේතුව කුමක් ද?
(ii) ඉහත කවිවල ඇතුළත් උපමාවක් උපුටා ලියන්න.
(iii) 'රන් රසු දැල් කොලහල වන බියෙනේ' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) **'රුපුනොද'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි)

- **(ඌ)** සහ **(එ)** ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

**(ඌ)** පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. ''වැලි තිට රජ කුලෙහි සම්පත්තීන් ප්‍රයෝජන කිම් ද''
ii. ''බල එකෙක් නම් මියයන ගමනේ මා සිතක් මතක් සේ වැඳ ගත දුන මැනව''
iii. ''මායමකින් බෙහෙත් තෙලක් පොවා මේ රජහුගේ ජීවිතය රැක දෙමි.''
iv. ''අපවිත්‍ර අමේධ්‍යය හා මනෝඥ වූ සුවඳ විහිදුණා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක කෙසේ නම් එක් වේ ද?''
v. ''අයියෝ අප්පොච්චිට නම් පිස්සු තිබිලා තියෙනවා; මාව මුදලාලිට දුන්නා නම් මීට නරක ද?''
vi. ''දැන් මේ ලියුම ගිහිං දිසාපති කන්තෝරුවට දීල පෝරම කොළයක් ඉල්ලං ඇවිත් මට දෙනව.... හොඳ ද.....''
vii. ''සඳා කලට පහන නිවී
අඳුර අරක් ගත් මේ ගේ තුළ
කෙලෙස ද මා පසුවන්නේ?
කුමට ද මෙහි කැඳවාගෙන ආවේ මා''

(ලකුණු 03 x04 = 12 යි.)

**(එ)** වස්තු විෂයය හා කාව්‍ය භාෂාව කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**ඉගිළෙන සිහින**

මිනිහා නඟන කට හඬ නොම වැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇති මුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමැති නැත හිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවු පිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙ ම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැති ව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුව සිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවු පිය කුරුල්ලන් ආහර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළි වෙන කොට හතර වටින්

(ලකුණු 12 යි.)

**2.** කතා වස්තුව හා සම්බන්ධ චරිත හා සිද්ධි නිරූපණයේ දී පොදුජන වහර සාර්ථක ව යොදාගෙන ඇති ආකාරය සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් විමසන්න.

**නැතහොත්**

ජීවිතයේ හමුවන විවිධ අභියෝග හමුවේ ස්ත්‍රිය ක්‍රියා කරන ආකාරය නිරූපණය කිරීමෙහි ලා ජාතක කතාකරු උත්සුක වී ඇති අයුරු නිර්දිෂ්ට කතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

**3.** පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

**(අ)** දඹදෙණි හා ගම්පොළ අවධිවල සාහිත්‍ය උන්නතියට බලපෑ කරුණු තුනක් සසාධක ව පැහැදිලි කරන්න.

(ලකුණු 07 යි.)

**(ආ)** පූජාවලිය කෘතියෙහි සාර්ථකත්වයට භාෂෝපක්‍රම උපයෝගී කරගෙන ඇති ආකාරය නිර්දිෂ්ට කතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

පුද්ගලාභ්‍යන්තර මානසික ස්වභාවය මැනවින් වටහාගෙන ඔවුන්ට ගෝචර වන ආකාරයට කතාවස්තු ඉදිරිපත් කිරීමට කතුවරයා දක්වන කුසලතාව සද්ධර්මාලංකාරයේ නිර්දිෂ්ට කතාවස්තු ඇසුරෙන් විමසන්න.

(ලකුණු 08 යි.)

**4.** “ගුත්තිල හා මූසිල චරිතවල ඇති පරස්පර විරෝධී චරිත ලක්ෂණ, ගුත්තිල කාව්‍ය නිර්මාණයේ රසවත්භාවය උද්දීපනය කිරීමට හේතු වී ඇත.” උචිත නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

**5.** බැද්දේගම නවකතාව පාඨක අවධානය දිනා ගැනීමට සමත් වී ඇත්තේ එහි අන්තර්ගත කලාත්මක ලක්ෂණ හේතුවෙනි. යෝග්‍ය නිදර්ශන ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 15 යි.)

**6.** ගැමිදිවිපෙවෙත මනාව රූපණය කිරීම පිණිස වහල්ලු කෙටිකතාව උපයෝගී කරගෙන ඇති ආකාරය නිදසුන් තුනක්වත් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15 යි.)

**7.** සමාජ විෂමතාව ඉස්මතු කිරීමට නූතන කවීන් උත්සුක වී ඇති අයුරු නිර්දිෂ්ට කාව්‍ය නිර්මාණ තුනක්වත් ඇසුරෙන් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

**8.** උපයුක්ත භාෂාවේ කාව්‍යාත්මකබව නාට්‍යයේ මුඛ්‍ය තේමාවට කොතෙක් දුරට උචිත වන්නේදැයි 'පෙමතො ජායති සොකො' නාට්‍යයෙහි එන නිදසුන් තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

***

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி cau; கல்வி kw;Wk; njhopw; கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv.Level) Examination, 2025

සිංහල II
சிங்களம் II
Sinhala II

**71 | S | II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

(i) **I** කොටසේ **1**ප්‍රශ්නය ද, **II** කොටසේ **2,3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
(ii) **1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
**(iii) I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමග **අමුණා භාර දෙන්න.**

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. කණ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ ක ඝ ඞ ඞ ඟ හ
(2) ආ ක ඛ ග ඝ ඞ අඃ
(3) ඉ ක ඛ ග ඝ ය ඟ
(4) ක ඛ ග ඝ හ ෂ අඃ
(5) ක ඛ ග ඝ ඟ හ ශ (---)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) සම්ප්‍රදායික, අර්බුධය, වෛකල්පික, අජටාකාෂ, යථාර්ථවාදය
(2) සාම්ප්‍රධායික, අර්බුදය, වෛකල්පිත, අජටාකාශ, යථාර්තවාදය
(3) සම්ප්‍රධායික, අර්බුධය, වෛකල්පිත, අජටාකාශ, යථාර්ථවාදය
(4) සාම්ප්‍රදායික, අර්බුදය, වෛකල්පික, අජටාකාශ, යථාර්ථවාදය
(5) සාම්ප්‍රදායික, අර්බුදය, වෛකල්පිත, අජටාකාශ, යතාර්තවාදය (---)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) පූජනීය, පූජාවලිය, පූජාර්හ, පූජාසනය, පූජෝත්සවය
(2) පූජාවලිය, පූජාර්හ, පූජාසනය, පූජනීය, පූජෝත්සවය
(3) පූජනීය, පූජාර්හ, පූජාවලිය, පූජාසනය, පූජෝත්සවය
(4) පූජාර්හ, පූජාවලිය, පූජාසනය, පූජනීය, පූජෝත්සවය
(5) පූජාවලිය, පූජාසනය, පූජෝත්සවය, පූජාර්හ, පූජනීය (---)

1.4. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) අනුස්වාරය ව්‍යඤ්ජන අක්ෂරයකට පසුව යෙදේ.
(2) අනුස්වාරය ශුද්ධ සිංහල හෝඩියට ඇතුළත් නොවේ.
(3) වර්ගාන්ත අක්ෂර වෙනුවට අනුස්වාරය නොයෙදේ.
(4) අනුස්වාරය යනු ස්වර අක්ෂරයකි.
(5) අනුස්වාරය නිග්ගහීතය යනුවෙන් ද හැඳින්වේ. (---)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) ස්ථාවර ගිණුම්, සොයුරු පෙම, තුරුණු ශක්ති, තිරසර සංවර්ධනය
(2) විශ්වාස භංග, භූ කම්පන, අසූ විය, ලොවුතුරු සුවය
(3) ළමා ලෝකය, විලාසිතා මැදුර, පහන් සංවේගය, සැඳෑ වැනුම
(4) බුද්ධ වර්ෂ, සරසවි ප්‍රවේශය, ශබ්ද විද්‍යාව, අතිකාල දීමනා
(5) පබඳ අත්වැල, විදු සක්විති, නා ලෝ, බැති පූජා (---)

1.6. තත්සම වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ප්‍රබෝධ, පාරුපන, සම්පූර්ණ, භාවිත
(2) කල්පනා, සමෝච්ච, කඳුළු, ආලේප
(3) ගද්‍රභ, ආරෝග්‍ය, වස්තු, සොඳුරු
(4) කුවෙර, කසුන්, උද්වේග, භෘංග
(5) සුභද, බාහු, කින්නර, කපාට (---)

1.7. තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) රුහිරු, අඳුරු, විදුරු, දාරු
(2) බාල, රාල, වේල, දැල
(3) කිසි, නිසි, රිසි, දිසි
(4) සහ, වහ, සීහ, කහ
(5) ද්‍රෝණි, මැණි, පාණි, දෝණි (---)

1.8. විභක්ති, අන්‍යාර්ථ, විශේෂණ, අව්‍යය යන සමාස පද **අනුපිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(1) සිවුරුපිළි, දෙව්දූව, නිල්ගෙල, අනුරාව
(2) දෙව්දූව, අනුරාව, සිවුරුපිළි, නිල්ගෙල
(3) අනුරාව, දෙව්දූව, නිල්ගෙල, සිවුරුපිළි
(4) නිල්ගෙල, දෙව්දූව, සිවුරුපිළි, අනුරාව
(5) සිවුරුපිළි, නිල්ගෙල, දෙව්දූව, අනුරාව (---)

1.9. කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ගැයුම්, කැවුම්, ඇමුණුම්, බහාලුම්
(2) වතළ, විසුළ, වපුළ, අතුළ
(3) දෘශ්‍යමාන, ධරමාන, ජීවමාන, වර්තමාන
(4) හැපුණු, මිදුණු, පොකුණු, බිඳුණු
(5) දරන, පීරන, පාරන, බේරන (---)

1.10. පහත දැක්වෙන උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ගෙට **ගිය** අඹු නසී

(ආ) **කියනුව** දිවා රැය

(ඇ) **බලමින්** දුදන ගති

(ඈ) සියල් ලෝ අසිරිමත් **කැරවී ය**.

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) අපරක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(4) මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(5) අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා (---)

1.11. තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ප්‍රියතර, ක්‍රෑරතර, ආස්තර, දැඩිතර
(2) ගරුත්ව, ගුරුත්ව, ලඝුත්ව, දේවත්ව
(3) ආර්ථික, වෛදික, භෞමික, නාමික
(4) පාපිෂ්ඨ, ධර්මිෂ්ඨ, කනිෂ්ඨ, ශ්‍රේෂ්ඨ
(5) මුහුළස්, වරලස්, සෙනෙහස්, සිසිලස් (---)

1.12. උපසර්ගයක් යෙදී **නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) සුපිපි, සුරත්, සුපුන්, සුපුල්
(2) දුදන, දුලබ, දුලද, දුගඳ
(3) ඉවහල්, ඉමිහිරි, ඉමහත්, ඉපැරණි
(4) පිළිබඳ, පිළිවෙළ, පිළිමල්, පිළිවෙත්
(5) ප්‍රකෝප, ප්‍රසංග, ප්‍රගුණ, ප්‍රබල (---)

1.13. නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) එහෙත්, නොහොත්, නමුත්, දුටොත්
(2) ඊයේ, නිබඳ, නිරතුරු, ඉතින්
(3) තෙක්, තුරු, සිට, පටන්
(4) නිසා, හින්දා, හෙයින්, බැවින්
(5) හා, සහ, සමග, යි (---)

1.14. "**සමුද්‍රාභ්‍යන්තරයෙහි** හට ගත් ප්‍රබල **භූමිකම්පාවට කලාපීය** රටවල් කිහිපයක් ගොදුරු විය." යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, තද්ධිත, සමාස
(2) තද්ධිත, සන්ධි, සමාස
(3) සමාස, තද්ධිත, සන්ධි
(4) සමාස, සන්ධි, තද්ධිත
(5) සන්ධි, සමාස, තද්ධිත (---)

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) යති, කති, ඇති, වෙති
(2) බිබී, සිසී, පිපී, දිදී
(3) බැඳුණි, ලැබුණි, හැඟුණි, අරුණි
(4) නහා, සනහා, වළහා, බහා
(5) කියත, කමත, කපත, දමත (---)

1.16. සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) කම්කරු, පරවැඩ, කසීසළු, බිඟු නද
(2) රන්රිදී, රටවට, සගමොක්, අඹුදරු
(3) නිලුපුල්, ඉහසුහ, දෙදණ, පාතඹර
(4) පන්සිළු, පරපුටු, සියපත්, කොමලඟ
(5) සුහුරු, උපවන, අනුරාව, අකල් (---)

1.17. එකම වර්ගයට අයත් සන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) උචිතානුචිත, සනීපාරක්ෂක, ඉෂ්ටානිෂ්ට, භාෂෝද්ග්‍රහණ
(2) බිලියම්, වම්මුතු, පන්සිය, කප්පිල්
(3) දිනිඳු, සදෙව්, තෙදැති, නොමරුල්
(4) මහේශ්වර, සූර්යෝදය, පූර්වෝක්ත, අත්‍යුදාර
(5) පත්තිරු, නොයිඳුල්, වියවුල්, නොයෙන (---)

1.18. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන වරණය කුමක් ද?
(1) දැත, දැගසවු, දැකැති, දැඟුල්
(2) විමති, විකාර, විවර, විතැන්
(3) කෘත, මෘත, ශ්‍රැත, භූත
(4) දීප්තිමත්, ධීමත්, සවිමත්, රූමත්
(5) අටනෙත්, බරනෙත්, සහස්නෙත්, තිනෙත් (---)

1.19. ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.
(1) දරුවෝ සියල්ලන් ම දෙමාපියන්ගේ ආරක්ෂාව ලබති.
(2) ඔබ සහ ඔහු සම්මන්ත්‍රණයට සහභාගි වූවෙහි.
(3) බොහෝ තරුණ තරුණියන් නව තාක්ෂණික මෙවලම් භාවිතයට කැමති ය.
(4) මා ඒ සොඳුරු පරිසරයෙහි දින කිහිපයක් ගත කොට ඇත.
(5) මව කුඩා දරුවෙක් සමඟ බසයට නැංගා ය. (---)

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) ප්‍රමාද වී රැස්වීමට පැමිණි සරත් පිටිපස්ස පේළියේ ඉඳ ගත්තේ ය.
(2) එම ලිපිය ලැබුණේ කවදා දැයි නොදනිමි.
(3) මා ඉන්නා තුරු දරුවන්ට දුකක් නොදෙමි.
(4) පොඩි කාලෙ හිටන් ම දරුවෝ පොත් කියවන්නට හුරු වෙති.
(5) නගරයට මෙතන ඉඳලා කිලෝමීටරයක් විතර ඇත. (---)

(ලකුණු 20යි.)

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සම්මත මත ද එහි පැවැත්ම ද කලින් කලට වෙනස් වේ. එහෙත් කිසි ම අධ්‍යාපන ක්‍රමයක් බාහිර සාධකයන්ගෙන් වෙන් ව නොපවතී. අධ්‍යාපනය සමාජයෙහි විවිධ බලවේගයන් බිහි කරන අතර එය එවැනි විවිධ බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වයෙහි සහ ප්‍රතික්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් ද වේ. වර්තමාන ලෝකයේ ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජයෙහි අධ්‍යාපනය ගතානුගතික ව නිමැවුණු අනම්‍ය ව්‍යූහයක් තුළට පත් කිරීම අසතුටුදායක දෙයක් මෙන් ම කළ නොහැක්කක් ද වේ. එසේ ම නොපෙනෙන තරම් දීර්ඝ අනාගතයක් සඳහා සැලැසුම් කිරීම ද නොකළ යුත්තකි. වර්තමානය ශීඝ්‍ර පරිවර්තන සමයයෙකි. හැම මනුෂ්‍ය ක්‍රියාවලියක්, ප්‍රයත්නයක් හා විද්‍යා ශාස්ත්‍රයක් කෙරෙහි ම දීර්ඝ කාලීන වශයෙන් බල පවත්වන ගැඹුරු පර්යේෂණ ද ගමනාගමන හා අදහස් හුවමාරු කිරීමේ වේගවත් ක්‍රම ද ජීවිතය සම්බන්ධ එදිනෙදා ප්‍රශ්න ද නිසා සමාජය බොහෝ සෙයින් ම සංකීර්ණභාවයට පත් ව ඇත්තේ ය. නවීන සමාජය සමග ඉදිරියට ගමන් කිරීමේත් එහි අනාගතය සැකැසීමේත් විශාල වගකීම අද අධ්‍යාපනයට භාර ය. මෙම සංකීර්ණ වර්තමාන ලෝකයෙහි සාර්ථක අන්දමින් ජීවත් වීම සඳහා අවශ්‍ය දැනීම් සම්භාරය සිතිය නොහැකි තරම් විශාල වී තිබේ. අද පාසල් යන හැම දරුවකු ම තම පියා එම වයසේ දී දැන සිටියාට වඩා අතිශයින් විශාල දැනුමක් ඇත්තකු විය යුතු ය. බොහෝ විට එම දැනීම වඩ වඩාත් ගැඹුරට ලබා සිටිය යුතු නිසා ඔහුගේ දෘෂ්ටිය පටු වී ඇත. වර්තමාන මිනිසාගේ ඇසට කනට ලක් වන දර්ශන සහ ශබ්ද සම්භාරයෙන් හේ කම්පනයට පත් වෙයි. හැම දිනක ම හැම මොහොතක ම පුවත් පත්වලින් ගුවන් විදුලියෙන් සහ චිත්‍රපටවලින් තොරතුරු රාශියක් අපගේ ඉන්ද්‍රියයන් වෙත එල්ල වන අතර එ මඟින් ඉතා ම මන්ද බුද්ධිකයාට පවා යම් දැනුමක් නොලබා සිටිය නොහැකි ය. ඒ නිසා මේවා වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම අධ්‍යාපන මාධ්‍යයෝ වෙති. හොඳට හෝ නරකට හෝ ඒවායේ ඇති බලය ඉමහත් වේ. අදහස් විපරීත කිරීම සහ බලයෙන් ආරෝපණය කැරවීම සඳහා මේ මාධ්‍යයන් හිතාමතා ම වැරදි ලෙස යොදා නොගන්නා වූ ලෝකයේ නිදහස් රටවල අධ්‍යාපනය සතු වගකීම් භාරය අතිශයින් ම විශාල ය. අධ්‍යාපන ක්‍රියාවලියේ පූර්ණ ප්‍රතිඵලය නිතර ම සිහියේ තබා ගත යුතු ව ඇත. ඇතැම් කරුණුවලට අවධානය යොමු කර අන්‍ය කරුණු අමතක කැරෙන අධ්‍යාපන ක්‍රමයක් සතුටුදායක යයි පිළිගත නොහැකි ය. එසේ වූ විට බාල පරම්පරාව එක් අංශයකට පමණක් නැඹුරු ව වැඩෙන අතර ඔවුහු ජීවිතය පිළිබඳ සමතුලනතාවක් නැත්තෝ වෙති. ජීවිතයේ සැපවත් දැ හැකි තරම් ප්‍රමාණයක් ලබා ගැනීම මිනිස් රුචියේ අවසාන පරමාර්ථය සේ සැලැකෙන ඉන්ද්‍රිය පිනවන පහසුකම්වලින් පරිපූර්ණ වර්තමාන සමාජයෙහි අධ්‍යාපනය නමැති යහමඟ යවන බලවේගය සුපරීක්ෂාකාරී ව සැලසුම් කළ යුතු වේ. සිද්ධස්ථානයේ දී කැරෙන ආගමික කටයුතු හැරුණු විට පන්ති කාමරයේ දී ආගම ධර්මය ඉගැන්වීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ද පාසල හා සමාජය අතර කිට්ටු සම්බන්ධතාවක් ඇති කරන විවිධ ක්‍රම මාර්ගයෙන් ද සුචරිත සාරධර්ම පිළිබඳ නියම අවබෝධයක් ඇති කිරීම කෙරෙහි අද මහත් සැලකිල්ලක් දැක්වේ. ජාතිය වෙනුවෙන් කෙරෙන සේවාව අධ්‍යාපන ප්‍රතිපත්තියෙහි මූලික ලක්ෂණයක් වී තිබේ.

(i) අධ්‍යාපනය අනම්‍ය ව්‍යූහයක් තුළට පත් කිරීම කළ නොහැක්කක් වන්නේ කුමක් නිසා ද?
(ii) සමාජ සංකීර්ණභාවයට තුඩු දෙන සාධක දෙකක් සඳහන් කරන්න.
(iii) නූතන පාසල් දරුවකු හා ඔහුගේ පියා අතර දැනුම සම්බන්ධයෙන් ඇති වෙනස කුමක් ද?
(iv) අසතුටුදායක අධ්‍යාපන ක්‍රමයක ස්වභාවය සඳහන් කරන්න.
(v) බාල පරපුර එක් අංශයකට පමණක් නැඹුරුව වැඩීමේ ප්‍රතිඵලය කවරේ ද?
(vi) නූතන සමාජයෙහි අධ්‍යාපනය සුපරික්ෂාකාරී ව සැලසුම් කළ යුත්තේ ඇයි?

(ලකුණු 02×6 = 12යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා සාරාංශයෙහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

මෑත යුගයේ දී සිංහලයේ සම්භවය පිළිබඳ ව උගතුන්ගේ විමර්ශනාක්ෂිය යොමු වන්නට පටන්ගෙන ඇත්තේ එකුන්විසි වන සියවසේ මුල හරියේ සිටයි. ක්‍රි.ව. සිවුවන සියවස තරම් ඈත අතීතයේ පටන් ම දේශීය විද්වතුන් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ විමර්ශනයන්හි යෙදුණු බවටත්, සිංහලය ඉන්දු - ආර්ය ගණයේ භාෂාවක් බව එබඳු බොහෝ විද්වතුන්ගේ පිළිගැනීම වූ බවටත්, මහාචාර්ය සෙනරත් පරණවිතාන ලක්දිව අන්තරාලීන ශිලාලිපි මඟින් සාධක ඉදිරිපත් කොට තිබේ. කෝට්ටේ යුගය අවසාන වන තෙක් මෙරට පහළ වූ - සිදත් සඟරා කතුවරයා ඇතුළු - දේශීය පඬිවරුන් වැඩි දෙනා සාම්ප්‍රදායික වශයෙන් සිංහලය, සකු - මගද දෙබස මවුබස් කොට ඇත්තකැයි විශ්වාස කළ බව සිතීමට හේතු සාධක ඇතත්, ඉන්පසු ඇති වූ භාෂා ශාස්ත්‍ර පරිහානියත් සමග එම දැනුම ද කෙමෙන් අපවත් වී ගිය බවක් පෙනේ.

එහෙත් ඉහත කී පරිදි 19 සියවසේ දී, පළමුව යුරෝපීය පඬිවරුන් විසින් සිංහලයේ සම්භවය පිළිබඳ විමසීමට හා විවිධ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමටත් පටන් ගැනීමෙන් පසු එම සියවසේ මධ්‍ය භාගය වන විට ජේම්ස් ද අල්විස් වැනි ඉංග්‍රීසි උගත් ස්වදේශීය පඬිවරුන් ද තදීය විමර්ශනයන්හි යෙදෙන අයුරු හා සංවාදයන්හි සහභාගි වන අයුරු දක්නට ලැබේ. තුලනාත්මක හා ඓතිහාසික වාග් විද්‍යාවෙහි එන විද්‍යාත්මක ක්‍රම උපයෝගී කොට ගෙන භාෂා පර්යේෂණයෙහි යෙදුණු මහාචාර්ය විල්හෙල්ම් ගයිගර් වැනි පඬිවරුන්ගේ කෘතීන් මඟින් විසි වන සියවසේ සිවුවන දශාබ්දය පමණ වන විට මේ පැනය තීරණාත්මක ව විසඳෙන තෙක් ම, දේශීය විදේශීය උගතුන් සෑහෙන ගණනක් සහභාගි වූ මේ විවාදය වරින් වර අලුත් වෙමින් පැවතිණ. මේ කාලය තුළ මෙසේ වාර්තාගත වී ඇති මතිමතාන්තර අතර භාෂාඥයන් විසින් ශාස්ත්‍රීය ස්වරූපයෙන් ඉදිරිපත් කළ අදහස් මෙන් ම, විදේශීය සංචාරකයන් විසින් තමන්ට හමු වූ ස්වදේශිකයන්ගෙන් හෝ විදේශිකයන්ගෙන් අසා ගෙන ලියූ කිසිදු ශාස්ත්‍රීය වටිනාකමක් නැති හිතලු, උපත් කතා හා ජනප්‍රවාද දක්නට ලැබෙන බව සැලකිය යුතු ය.

සමස්තයක් වශයෙන් ගෙන සලකා බලන කල සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ ව දක්වා ඇති මතිමතාන්තර හා නිරීක්ෂණ සියල්ල දෙවගකට බෙදිය හැකි බව පෙනේ. ඉන් පළමු වැන්න නම් සිංහලය ඉන්දු ආර්ය ගණයට අයත් භාෂාවකි යන්නයි. දෙවැන්න නම් අනාර්ය හෙවත් ඉන්දු - ආර්ය ගණයෙන් අන්‍යතර වූ භාෂාවක් යන්නයි.

(ලකුණු 13යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සංවර්ධන ක්‍රියාදාමයේ දී අවධානය යොමු කළ යුතු පාරිසරික ප්‍රතිපත්ති
(ii) සමබර පෞරුෂයෙන් යුතු දරුවකු ගොඩනැගීමෙහි ලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විෂයයෙහි පැවරී ඇති කාර්යභාරය
(iii) දෛනික ව සිදුවන මාරක රිය අනතුරු කෙරෙහි බලපාන හේතු සාධක
(iv) පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි යොමු වීමෙන් රටට, ජනතාවට හා පරිසරයට සැලසෙන වාසි
(v) වසංගතයක් ලෙස පැතිරී යන මත්ද්‍රව්‍ය උවදුර රටේ සංස්කෘතිය හා සමාජ ආරක්ෂාවට සිදු කරන බලපෑම

(ලකුණු 25යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මිනිස්සු ශ්‍රමදානයෙහි නිරත වෙද්දී ගම්වැසියෝ තේ සැපයූහ.
(ii) ඕ තොමෝ නිවේදිකාවක් වුව ද නිවසේ කටයුතු නොපිරිහෙළා ඉටු කළා ය.
(iii) අපි සියල්ලන්ම ලක්වැසියෝ වෙමු.
(iv) ඥාති මිත්‍රාදීහු ප්‍රිය සාදයට පැමිණේවි.
(v) දරුවනි, මේ පන්තියේ අනෙක් ළමයින් කෝ?

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ආයතන කළමනාකරු සම්මුඛ පරීක්ෂණය සඳහා අප කැඳවී ය.
(ii) පොලිසිය සිද්ධියට අදාළ සැකකරුවකු අත් අඩංගුවට ගති.
(iii) නගර සභා සේවකයෝ දිරූ ගස කපා ඉවත් කරති.
(iv) විදුහල්පතිවරයා ගුරුතුමිය ද ශිෂ්‍යාවන් ද ප්‍රශංසාවට ලක් කළේ ය.
(v) රජය නිලධාරීන් ලවා සත්ත්ව සංගණනයක් කරවී ය.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සාමාජිකයන් (සියල්ලෝ ම / සියල්ලන් ම) රැස්වීමට (එති / ඒවි) යි ලේකම්වරයා සිතී ය.
(ii) ජනාධිපතිවරයා (නාහිමියෝ / නාහිමියන්) වෙත අක්ත පත්‍ර (පිළිගැන්වූහ / පිළිගැන්වීය).
(iii) මහාචාර්ය සුචරිත ගම්ලත් භාෂා (විශාරදයෙක් / විශාරදයෙකු) මෙන් ම සාහිත්‍ය (විචාරකයෙක් / විචාරකයෙකු) ද විය.
(iv) (මම / මා) ඔබ හමු වී සාකච්ඡා කිරීමට (කැමැත්තෙමි / කැමැත්තෙහි.)
(v) (නායකයෝ / නායකයන්) ආදර්ශවත් (වේ / වෙත්) නම් සමාජය වඩාත් යහපත් වනු ඇත.

(ලකුණු 05×3 = 15යි.)

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු-අංගය** දක්වන්න.

(i) **මවුපියෝ දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය** ගැන සතුටු වෙති.
(මවුපියෝ - සමාස, දරුවන්ගේ - විභක්ති, කෞශල්‍යය - තද්ධිත)
(ii) **මහාධිකරණ** විනිසුරු **විසින්** ඇප **ඉල්ලීම** ප්‍රතික්ෂේප කෙරිණි.
(මහාධිකරණ - සන්ධි, විසින් - නිපාත, ඉල්ලීම - කෘදන්ත)
(iii) **ප්‍රවීණ** ලේඛකයා **ආධුනික** පිරිස **අමතා** අගනා කතාවක් කළේ ය.
(ප්‍රවීණ - විශේෂණ, ආධුනික - තද්ධිත, අමතා - ක්‍රියා)
(iv) **සියලු** සත්ත්වයෝ **යෙහෙන්** වාසය **කරත්වා.**
(සියලු - නාමපද, යෙහෙන් - විශේෂණ, කරත්වා - ක්‍රියා)
(v) **නියං සමයේ සිඳී යන** බොහෝ **වැව් පොකුණු** වැසි සමයේ පිරී යයි.
(නියං සමයේ - සන්ධි, යන - කෘදන්ත, වැව්පොකුණු - සමාස)

(ලකුණු 03×5 = 15යි.)

6. (අ). පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) රට ක්‍රමයෙන් දියුණු වන විට තරුණ පරපුරේ .................................. සිහින ඉටු වනු ඇත.

(ii) තුරු ලිය පිස එන මඳ ............................ ගත සිත සනහාලයි.

(iii) පනාමුරේ ................................... රාජයා සිය වර්ගයා වෙනුවෙන් දිවි පිදී ය.

(iv) වේගයෙන් හැමූ සුළි ................................ ගල් වැල් පෙරළා දැමී ය.

(v) ඔබගේ ............................... ප්‍රාර්ථනා සියල්ල ඉටු වේවා!

(vi) .............................. අස් රිය පාබල සේනාවෝ මියුලු නුවර වටලා ගත්හ.

( හස්ති, සුළඟ, ඇත්, සුබ, පවන, ශුභ )

(ලකුණු ½ ×6 = 03යි.)

**(ආ)** පහත දක්වා ඇති පද සන්ධි කරන්න.

| | | |
|---|---|---|
| (i) උස් + අසුන් | (ii) කට + ඇටි | (iii) වැල් + මල් |
| (iv) සාධු + උක්ති | (v) නි + උදක | (vi) හෙළිලි + අඹු |

(ලකුණු ½ ×6 = 03යි.)

**(ඉ) තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) පැරණි **රජදරුවෝ** වැව් අමුණු **පණ** මෙන් රැක ගත්හ.

(ii) **මිනිසුනි, දුසිරිතෙන්** මිදී සුසිරිත වඩවු.

(iii) අපි **වත්තෙහි** සිට වූ **පැළවලට** වතුර දැම්මෙමු.

(ලකුණු ½ ×6 = 03යි.)

**(ඊ)** අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

දුටුගැමුණු දුටඨ ගාමිණී අභය නරේන්ද්‍රයා සතුරු බළ මුළු පරදා රට එක්සේසත් කොට මම මහා සෑය තනවමි යි යන අදිටනින් ඊට සුදුසු භූමිය විමසන කල්හි ඒ ස්ථානයේ රන් තෙලඹු ගසට අධිගෘහිත දේවතාවිය වූ ස්වර්ණමාලිය තම විමන නොනසන ලෙස අයැද සිටි විට අහෝ දේවතාවිය ඔබට අන් තැනක් සකසා දෙමි මේ සත්කාර්ය ඉවසාලන්නැයි කියා සෑය ඉදි කොට ප්‍රතිඥා පරිදි ඇගේ නමින් ස්වර්ණමාලි නමින් මහා සෑය නම් කළේ ය

(ලකුණු ½ × 6 = 03යි.)

**(උ)** පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "එකමුතුකමින් ක්‍රීඩා කළ නිසා අපි තරගය ජයගත්තා" යි ජයග්‍රාහී පිළේ නායකයා මාධ්‍ය හමුවේ කී ය.

(ii) "ශිෂ්‍යාවනි, පාසලේ ගෞරවය ආරක්ෂා කරන්න" යි විදුහල්පතිනිය පැවසුවා ය.

(iii) "ඔබ අනාගත අභියෝග හමුවේ නොසැලී සිටිය යුතු ය" යි දේශකයා ප්‍රකාශ කළේ ය.

(ලකුණු 1 × 3 = 03යි.)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජනකවියෙහි හා පැරණි පද්‍ය **ග්‍රන්ථයන්හි** පැනෙන බස් වහර හා උපමා රූපක පදනම් කොට ගැනීම නිසා නවීන සිංහල පද්‍යය පාරම්පරික සම්ප්‍රදායට අනුබද්ධ කිරීමටත් ඒවාට ජනප්‍රියත්වයක් ලබා ගැනීමටත් හැකි වූ නමුදු **ඔවුන්ගේ** රචනා කියවන විට මූලික ප්‍රශ්න දෙකක් නැඟීමට සිදු විය. ඉන් පළමුවැන්න නම් මධ්‍ය කාලීන සරල කෘෂි කාර්මික සමාජයක උපත ලද ජන කවියෙහි හා පැරණි සිංහල විදග්ධ පද්‍යයෙහි භාෂාව, උපමා, රූපක, ආකෘතිය **වර්තමාන** සංකීර්ණ සමාජයේ සිතුම් පැතුම් හා අත්දැකීම් **ස්පර්ශනීය** ලෙස නිරූපණය සඳහා ප්‍රමාණවත් වේද යන්නයි. මේ **තර්කයෙහි** සහේතුකතාවක් ඇත. ජනකවිය ආශ්‍රය භූමි කොට ගෙන රචිත සාර්ථක පද්‍ය හැම එකක් ම පාහේ සරල **අත්දැකීම්** මුල් කොට ගත් ඒවා ය. එසේ නම් මේ කාව්‍ය මාර්ගයේ යමින් **සමකාලීන** මානුෂික අත්දැකීම් කාව්‍යගත කරන්නේ කෙසේ ද යන්න බොහෝ දෙනෙකුගේ සම්මර්ශනයට පාත්‍ර වූ මාතෘකාවක් වූයේ ය. දෙවැන්න නම් නවීන කවීන් ජන කවි බස හා පැරණි කවි බස පදනම් කරගත්තොත් කවියෙකුගෙන් අපේක්ෂිත මූලික කර්තව්‍යයක් වන භාෂාමය නිර්මාණයක් සිදු වීමට අවකාශයක් තිබේ ද යන්නයි.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.
(ii) නියුක්තාර්ථය හා සම්බන්ධාර්ථය පළ කරන තද්ධිත නාම **තුනක්** උපුටා දක්වන්න.
(iii) උපසර්ග සහිත පද **තුනක්** උපුටා දක්වන්න.
(iv) සහේතුකතාවක්, කවියෙකුගේ, ආකෘතිය යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
(v) ඝෝෂ මහාප්‍රාණ අක්ෂර සහිත වචන **තුනක්** ලියන්න.

(ලකුණු 03 × 5 = 15යි.)

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මිශ්‍ර ක්‍රියාව
(ii) අවධි විභක්තිය
(iii) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
(iv) ගෞරවාර්ථයේ තද්ධිත ප්‍රත්‍යය
(v) උපමා පූර්ව පද විශේෂණ සමාසය

(ලකුණු 05 × 3 = 15යි.)

****

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025

71 - සිංහල

ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

1. (අ.)

(i) තමා හා වාද කරන්නට කැමති අයෙකු සිටී නම් දඹ අත්ත පොඩි කරනු ඇතැයි සිතා ය.
(ii) ගිහි කෙනෙක් තොප හා වාද කළ හැකි වූවෝ නම් උන්ට පාදපරිචාරිකා (භාර්යාව) වන්න. පැවිදි කෙනෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ළඟ මහණ වන්න.
(iii) ඒ ඒ තැන්වල සිටින මිනිස්සු ජම්බුපරිව්‍රාජිකාව එන බව ඇසූ විට ඇයගේ නමට ම දුරදීම බිය වී පලා යති.
(iv) නියමයකි.

(ලකුණු 01 x 04 = 04 යි.)

(ආ.)

(i) මෙහි සඳහන් කාන්තාව ඇයගේ ස්වාමිපුරුෂයා මළහොත් තමා සමග වාසයට පැමිණේයැයි සිතා.
(ii) සිවලුන් (හිවලුන්), බල්ලන්, කපුටන්, කබරගොයින් ආදීන් විසින් කා කඩා නොදමන ලද ශරීරයේ බැඳීම් ඇති මළ සිරුරක්.
(iii) ප්‍රේත, පිශාච, යක්ෂ, රාක්ෂයන් වැනි අමනුෂ්‍ය විශේෂයන් ගැවසී ගත්.
(iv) දේව පූජා පිදේනි හා යාග කිරීම් ආදි ක්‍රියා.

(ලකුණු 01 x 04 = 04 යි.)

(ඉ.)

(i) සය මාසය / හය මාසයක්, හත් මාසයක්
(ii) මුලින්ම කුඹුරු අවට කැලෑ ප්‍රදේශය ශුද්ධ කොට ඇළ මාර්ග පාදා ගැනීම.
(iii) එම ගොයම් නිල්පාට වන අවස්ථාවෙහි කුඹුර මැද ගොවිපළ රැකීම සඳහා පැලක් සාදා ගැනීම.
(iv) ආරක්ෂාවට රෝග නිවාරණයට කරන ක්‍රියා / කෙම් කිරීම්, පහන් තැබීම් ආදි පූජා විධි.

(ලකුණු 01 x 04 = 04 යි.)

(ඊ.)

(i) මළ වෙස් ලා වැදහොත් එකකු පරිද්දෙන්
(ii) මෙවැනි තැන්වල වාසය නොකරන්න. පර්වතයෙන් බැස මිනිසුන්ට විශේෂ තැන්වල වාසය නොකරන්න.
(iii) එම අවස්ථාවෙහි විෂ නැති වී වණය (තුවාලය) සුව වී ඊතලය වැදුණු ස්ථානය කොතැන ද යන්න දැකිය නොහැකි විය.
(iv) තනිකම / හුදෙකලාව

(ලකුණු 01 x 04 = 04 යි.)

(උ.)

(i) පැතිරෙන වීණා නාදයෙහි සිත බැඳුණු හෙයින්
(ii) පිළිරූ මෙන්
(iii) ස්වර්ණ කිංකිණි ජාලා සෙලවෙතැයි බියෙන්
(iv) සතුරන්ගේ එඩිය

(ලකුණු 01 x 04 = 04 යි.)

(ඉ.)

(i) කුරුණෑගල අවධියේ දී ලියැවුණු පන්සිය පනස් ජාතක පොතේ චන්දකින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. රජතුමාගේ පාදපරිචාරිකාව වීමට අකමැති බව කිඳුරිය ප්‍රකාශ කළ අවස්ථාවේ රජතුමා ඇය අමතා කරන ලද ප්‍රකාශයකි.

(ii) දඹදෙණි අවධියේ දී ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ කුණ්ඩලකේසීගේ වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. සොරා කුණ්ඩලකේසී මරන්නට ගෙන ආ අවස්ථාවේ දී සොරා අමතා කුණ්ඩලකේසිය විසින් ප්‍රකාශ කරන ලද්දකි.

(iii) දඹදෙණි අවධියේ දී බුද්ධපුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ ජීවක වෛද්‍යවරයාගේ කතාවෙන් උපුටා ගත් පාඨයකි. චණ්ඩප්‍රද්‍යෝත රජුට ප්‍රතිකාර කිරීමට පැමිණි ජීවක වෛද්‍යවරයා කළ යුතු ප්‍රතිකාර ගැන තමා ම සිතන අවස්ථාව.

(iv) ගම්පොළ යුගයේ දී දෙවන ධර්මකීර්ති සංඝරාජ හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. ස්වර්ණතිලකා කෙරෙහි බැඳුණු උද්දාල බමුණා තමාට පිහිටක් වන ලෙස මිතුරන්ගෙන් ඉල්ලූ අවස්ථාවේ මිතුරන් විසින් උද්දාල බ්‍රාහ්මණයාට පවසන ලද්දකි.

(v) ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත `විලේජ් ඉන් ද ජංගල්` නවකතාවේ සිංහල අනුවාදය වන ඒ.පී.ගුණරත්නගේ බැද්දේගම කෘතියෙන් උපුටා ගන්නා ලද පාඨයකි. ආරච්චිල හා ප්‍රනාන්දු මුදලාලි මරා දැමීමෙන් අනතුරුව පුංචිමැණිකා වෙත පැමිණි සිලිඳු විසින් ඇයට එය ප්‍රකාශ කළ අවස්ථාවේ පුංචි මැණිකා විසින් සිලිඳුට පවසන ලද්දකි.

(vi) කීර්ති වැලිසරගේ විසින් රචිත "කළුකහවණු" කෙටිකතා සංග්‍රහයේ නිදහස් උදෑසන කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද්දකි. කොස් ගහ කැපීම සඳහා අවසර ලබා ගැනීමට දිසාපති කාර්යාලයට ගෙන යාමට අවශ්‍ය ලිපිය ලබා දී සරණේරිස්ට ග්‍රාම සේවක විසින් පවසන ලද්දකි.

(vii) එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත `පෙමතො ජායතී සොකො` නාට්‍යයෙන් උපුටා ගන්නා ලද්දකි. ස්වර්ණතිලකා හොඬින් ඔසවා බිම දැමූ සැටි දුටු උද්දාල බමුණා නිවසට රැගෙන ඒමෙන් පසු සිසුන් අමතා ප්‍රකාශ කරන ලද්දකි.

(ලකුණු 03 x04 = 12 යි.)

ලකුණු දීමේ නිර්ණායක :-

කතුවරයා, කෘතිය, කථා වස්තුව / කතාව සඳහා ලකුණු 01යි.

කා විසින් කාහට කියන ලද ද ලකුණු 01යි.

අවස්ථාවට ලකුණු 01යි.

(ඊ) **ඉගිළෙන සිහින පද්‍ය පන්තියෙහි රසාස්වාදය**

තමාගේ කූඩුවෙන් ඉගිළී යාමට සිහින දකින සහ එම සිහිනය යථාවක් බවට පත් කරගත් කුරුල්ලෙකුගේ ඇසින් මෙම පද්‍ය පන්තිය රචනා වී තිබේ. තෝරාගත් අද්දැකීම කාව්‍යෝපක්‍රම මගින් රසවත් කොට ඉදිරිපත් කිරීමට කවියා උත්සාහ ගෙන ඇත. පහත සඳහන් ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් මෙම කවි පෙළ රසාස්වාදය කිරීම අපේක්ෂා කෙරේ.

1) ස්වකීය කූඩුවෙන් ඉගිළී යාමට සිහින දකින කුරුලු පැටවකු මෙම පද්‍ය පන්තියට විෂය වී තිබේ.

2) අපූරු කාව්‍යෝක්ති භාවිතය

`උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව`
´ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට`

3) සරල සුගම බස් වහර
"හොඳ බව පෙනෙයි"
"කටට ම හෙළන මුත් ආහර"

4) නිදහස පිළිබඳ උද්දීපනය වන කවි පද
"දෙනෙතට නිල් අහස යොමු වන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි"

"කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළත වැඩිය පිට"

5) අධිෂ්ඨානශීලී බව හෙළිවන පද
"උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක"

"සටනක් නැතිව සැපතක් ඇති විය නොහැක"

6) පාඨකයාට ප්‍රිය උපදවන තාලයකට අනුගතව පැදිපෙළ නිර්මාණය වීම.

(ලකුණු 12 යි.)

2 (අ). චරිත හා සිද්ධි නිරූපණයේ දී පොදු ජන වහර සාර්ථක ව යොදා ගෙන ඇති ආකාරය සද්ධර්මරත්නාවලියෙන් හඳුනාගත හැකිය.

(සංවාද භාෂාව)

**කුණ්ඩල කේසී වස්තුව**

"සොඳුර, එදවස් මරන්ට ගෙනයන ගමනේ සොරුන් හෙළන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි."

"දෙවියන් පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොපිම අල්වා ගනුව."
"මට බිලියමින් කම් නැත. බිලියම් පිට ලාලා තොප මෙතැනට ගෙනෙන පිණිස යයි කීය."

"මුගේ කටයුත්තක් ඉතා නපුරු නියාය."
"බල එකෙක් නම් මිය යන ගමනේ මා සිතක් මතක් සේ වැදගත දුන මැනව."
"යහපත සොඳුර වඳුව...."

**මට්ට කුණ්ඩලී වස්තුව**

"තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේය."
"අනේ මේ මහා ලෝභී එකෙක් වනැ..."
"ළදරුව තෝ ඉතාම නුවණ නැත්තේය."
"මා දිවිහිමියෙන් හඬා ඇවිදතත් ඒ උන් දක්නට නැත."

ආදි වශයෙන් යෝග්‍ය උදාහරණ දැක්විය හැකිය.

**ගැමි ජන දිවිය හා සබැඳි උපමා භාවිතය ජනවහරේ සුවිශේෂත්වය කියා පායි.**

- කොබොළිල මල් දමක් වැනි
- විදුලියක් හා සමාන වූ
- බඳුවදමල් ඇතිරියක් බඳු වූ
- රන් ගුහාවකින් නික්මෙන සිංහයෙක් පරිද්දෙන්
- බුලත් දෙවා සාදය නිමවන්නා සේ
- රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රන් නෙලුම් වනයක් මෙන්
- යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරු මඬලක් මෙන්

<u>ප්‍රස්තාපිරුළු භාවිතය / ආප්තෝපදේශ</u>

- නුවණ නම් ඇතිවන්නා පලා ගෙන කන්ට නොවත් ප්‍රයෝජන නිසා වුව
- ඇඹුලකින් තඹ මලකඩ නැතිවන්නා සේ
- පය බරවායට පිටිකර බෙහෙත් බඳිනා සේ
- ඇස් සරහන්නට තොල අඳුන් ගානා සේ
- අත් දුටු බෙහෙත් තිබියදී ඔබ්බේ බෙහෙත් විචාරන්නා සේ
- ආඳා යවා තබාලා වල්පත ගත්තා සේ

ආදි ප්‍රස්තාපිරුළු / ආප්තෝපදේශ ආදියෙන් ද මෙම පොදු ජන වහර පෝෂිත වී ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුය. වෙනත් යෝග්‍ය උදාහරණ ද පිළිගන්න.

- සොර දෙටු තමා හැරගිය බව දැන ගත් අවස්ථාවේ දී ඉදිරිය ගැන සිතමින් වනයේ දිවිගෙවීම.
- ශක්‍රයා ඇය වෙහෙසන්නට ක්‍රියා කළ අවස්ථාවේ දී ද නොසැලී සිටීම.

**චන්ද කින්නර ජාතකය**

- තම කිඳුරු සැමියා මිය ගිය අවස්ථාවේ දී රජුගෙන් එන යෝජනාව ප්‍රතික්ෂේප කිරීම.
- තම කිඳුරු සැමියාට හී විදි රජුට සාප කරමින් නොබියව යුක්තිය ඉල්ලා සිටීම.
- ඇයට වූ ව්‍යසනය හමුවේ ඉතා බලසම්පන්න රජෙකුට තනිව මහ වන මැද අභියෝග කිරීම.

වෙනත් සුදුසු උදාහරණ ඇසුරෙන් පිළිතුරු සපයා ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න.

**නැතහොත්**

විවිධ අභියෝග හමුවේ ස්ත්‍රිය ක්‍රියා කරන ආකාරය ජාතක කතා කරුවා ඉතා සජීවී ලෙස ස්වකීය කතාවස්තු ඇසුරෙන් රූපණය කර තිබේ.

**චුල්ලධනුද්ධර ජාතකය**

- චුල්ලධනුද්ධර ජාතකයේ එන කුමරියගේ චරිතය මගින් ඇය අභියෝග හමුවේ නොසැලෙන ආකාරය මැනවින් නිරූපණය කර තිබේ.

  උදා :-

  තම සැමියාගේ විධානය පරිදි දඩ මස් ඉල්ලාගෙන ඒම සඳහා සොරුන් වෙත යෑම. එම අවස්ථාවේ දී ඇයගේ නිර්භීත බව හා ස්වාමිභක්තිය පිළිබිඹු වේ.

❖ මහවනමැද මුහුණ දෙන නොසිතූ ව්‍යසන මැද ඇය නොසැලී ක්‍රියා කරන ආකාරය
❖ ස්වාමියා මියගිය පසු ඇය සොර දෙටුවා සමග යෑමට සූදානම් වීම.
❖ ජීවිතයට එන අභියෝග හමුවේ අවස්ථෝචිත ලෙස කටයුතු කිරීම.

**3 (අ.)**

**දඹදෙණි අවධියේ සාහිත්‍ය උන්නතියට බලපෑ කරුණු**

1. රාජ්‍ය අනුග්‍රහය.
   II වන පරාක්‍රමබාහු රජතුමාගේ විශිෂ්ට වූ රාජ්‍ය අනුග්‍රහය දඹදෙණි අවධියේ සාහිත්‍ය උන්නතියට බලපෑ අතර එතුමා ද සාහිත්‍යකරුවෙකු වීම සුවිශේෂ වේ. ග්‍රන්ථකරණයෙහි නිරත විද්වතුන් වෙත මෙතුමා සුවිශාල අනුග්‍රහයක් දැක්වීය.

2. ආගමික පුනරුදය
   ධර්ම ග්‍රන්ථ, ටීකා අටුවා ආදිය සිංහලට පරිවර්තනය වූ අතර භික්ෂූන් වහන්සේලා ග්‍රන්ථකරණයෙහි නිරතවීම ද කැපී පෙනුණි.

3. විද්‍යාස්ථාන බිහිවීම සහ පිරිවෙන් අධ්‍යාපනයේ අභිවෘද්ධිය
4. සිදත් සඟරාව වැනි ව්‍යාකරණ ග්‍රන්ථ රචනා වීම මගින් සිංහල භාෂාවේ ප්‍රමිතිය වැඩි දියුණු වීම
5. පාලි හා සංස්කෘති භාෂාවල බලපෑම
6. විවිධාංගීකරණයට ලක්වූ පුළුල් සාහිත්‍ය සම්ප්‍රදායක් බිහිවීම (විවිධ ආකෘතිවලට අනුගත වූ කෘති ලියවීම)

7. ආර්ථික දියුණුව හා දේශපාලන ස්ථාවරත්වය

**ගම්පොළ අවධියේ සාහිත්‍ය උනන්තියට බලපෑ කරුණු**

1. රාජ්‍ය අනුග්‍රහය
2. ආගමික පුනරුදය හා බෞද්ධ සාහිත්‍යය නිර්මාණ බිහිවීම
3. පිරිවෙන් ආදි අධ්‍යාපන ආයතන බිහිවීම
4. පාලි, සංස්කෘත හා දෙමළ භාෂාවේ බලපෑම
5. සන්දේශ සාහිත්‍යයේ සමාරම්භයත් සමග කාව්‍ය සාහිත්‍යයේ නව්‍ය ප්‍රවණතා ඇතිවීම
6. ධර්ම කීර්ති පරම්පරාවේ සාහිත්‍ය සේවය

යෝග්‍ය උදාහරණ සඳහා ලකුණු ලබා දෙන්න.

**(ආ).**

පූජාවලිය කෘතියෙහි සාර්ථකත්වය සඳහා භාෂෝපක්‍රම උපයෝගී වී ඇති ආකාරය පැහැදිලි විය යුතුය.

❖ ධර්මදේශනා රීතිය උපයෝගි කර ගැනීම.

පෙර මේ අනුරුද්ධ කුමාරයෝ එක් ජාතියෙක දිළිඳු වූ කුලයෙක ඉපැද....
විශාලා මහනුවර අම්බපාලි නම් ගණිකාවක් ඇත. ඕ තොමෝ දිව්‍ය සමාන වූ ශරීර වර්ණ ඇත්තීය...

❖ උපමා භාවිතය

- එකල සිටාණෝ ශුෂ්ක කාෂ්ඨයක් සේ වියළී

- තෙල්පතක් වැළැන්දා සේ
- මුළු දඹදිව නැගූ ධජයක් සේ
- සුළං දුටු ගිනිකඳක් සේ කිපී
- දිව්‍ය ඖෂධ ලදින් අමාදිය ලදුවන් සේ
- මේ සසර නම් නුවණැසින් බැලුවානට විඩම්බනාවක් වැන්න. පිදුරු කැරැල්ලක් සේ අක් මුල් නැතියේ ය. ගුළ නම් ලිහිණියන්ගේ කසල්ලක් සේ පිළිවෙළක් නැත්තේය.

❖ රූපක භාවිතය
බුද්ධශාසන නමැති ආකාශයෙහි....
බුද්ධශාසන නමැති දිව්‍යරූපයෙහි....

❖ අනුප්‍රාසයට හා ශබ්ද ධ්වනියට මුල්තැන දීම

I. ඖෂධයකට නොගත හැකි මුලක් මලක් පොත්තක් අත්තක් ඵලයක් පතක් සොයා ගෙන...
II. එසේ වූ බතත් දොර දොර සිහා ඇවිද ලද මනා ල. බඩ සායයි කියා නොහැකි ල. ඇඹුල් ලුණු බෝ ය. මදයයි කියා නොහැකි ල. හුණු කැමති සිහිල් ලැබේ ල.

❖ සිද්ධි අනුලෝම ව ප්‍රතිලෝම ව ඉදිරිපත් කිරීමේ රචනෝපක්‍රමය
"කලෙක ශක්‍රසුයාම සන්තුෂිතා දි දිව්‍ය රාජ්‍යයන්ව සුව විඳියාහු පවා කලෙක ප්‍රේත ලෝකයෙහි ඉපිද ප්‍රේත දුක් විඳිනාහුම ය. කලෙක දිව උයන්වල දිව කෙළි කෙළ ඇවිද්දාහු කලෙක අසිපත් වෙනෙහි කැපි කැපී ඇවිදිනාහුය."

සුදුසු උදාහරණ ඇසුරෙන් භාෂෝපක්‍රම භාවිතය පිළිබඳ සාකච්ඡා කර ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න.

**නැතහොත්**

පුද්ගලාභ්‍යන්තර මානසික ස්වභාවය මැනවින් වටහාගෙන සද්ධර්මාලංකාරයේ කතුවරයා කතා වස්තු ඉදිරිපත් කර ඇත.

**ස්වර්ණතිලකා වස්තුව**

- ස්වර්ණතිලකාගේ උඩඟු මානසික ස්වභාවය නිසා සමකුල විවාහ යෝජනා ප්‍රතික්ෂේප කිරීම.
"ඕතොම එපවත් අසා චණ්ඩාල බ්‍රාහ්මණයාගේ පුත්‍රයාට පිළිකුල් ව නොයෙක් ආක්‍රෝශ පරිභව බැන නින්දා කළා ය."

- උසස් කුලයේ අයෙකු විවාහය සඳහා මුණගැසෙන තුරු ස්වර්ණතිලකා කටයුතු කරන ආකාරය

- උද්දාල බමුණාගේ ස්ත්‍රී පිළිකුල් චින්තනය ඉතා තාත්වික ව රූපණය කිරීම.
ස්ත්‍රීන් දුටු කල්හි ජුගුප්සා කටයුතු වූ ඉතා පිළිකුල් ජාතියෙකැයි නින්දා බැණ ඔවුන් හා සහවාසය නොකෙරෙයි.

- ස්වර්ණතිලකා දුටු පසු උද්දාල බ්‍රාහ්මණයාගේ සිත ක්‍රියා කරන ආකාරය
"විපරිතව පෙරළියා වූ සිත් ඇති හෙයින් වැටහෙන්නා වූ කිසි කාරණයකුත් නැත. සියලු දිගන්තරය අන්ධකාර වූවක් මෙන් වලිතව වැටහේ."

"මෙබඳු ස්ත්‍රී රත්නයකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැයි" යි මහත් වූ ශෝකයෙන් නොයෙක් ප්‍රලාප කියකියා.

නන්දිවාණිජ වස්තුව

- අමාත්‍යවරයා වෙළඳභාර්යාව දැකීමෙන් ඇතිවූ චිත්තවිපර්යාසය ප්‍රකට වීම.
  --- වෙළඳ භාර්යාව දැක උන්ගේ රූප නමැති සුරාපානයෙන් එම විට උමතුව ගියා සේ මූර්ඡාව භ්‍රාන්ත ව ගිය සිත් ඇතිව---

- වෙළඳ භාර්යාව තමා සතුකරගනිමියි සිතා අමාත්‍යවරයා විසින් නන්දිය වෙළෙන්දා මැරීමට සැලසුම් කිරීම.

වෙනත් යෝග්‍ය උදාහරණ ද පිළිගන්න.

4. ගුත්තිල හා මූසිල චරිතවල ඇති පරස්පර විරෝධී චරිත ලක්ෂණ ගුත්තිල කාව්‍යයේ රසවත්භාවය උද්දීපනය වීමට හේතු වී ඇත.

ගුත්තිල චරිතය

- සාම්ප්‍රදායික තරුණයෙකි.
- දෙමාපිය උපදෙස්වලට අනුගතව කටයුතු කරන්නෙකි.
- ගුරුමුෂ්ටියෙන් තොරව ශිල්ප බෙදා දෙන්නෙකි.

මූසිල චරිතය

- ශාස්ත්‍රය ඉගෙනීම පිණිස නොපසුබට උත්සාහයෙන් කටයුතු කරන්නෙකි.
- තම අරමුණ ම ඉලක්ක කොටගෙන කටයුතු කරන ආත්මාර්ථකාමී තරුණයෙකි.
- උගත් ශාස්ත්‍රය පිළිබඳ ගෞරවයකින් කටයුතු නොකරන්නෙකි.
- ගුරු ගෞරවය පිළිබඳ හැඟීමක් නැති තරුණයෙකි.

උක්ත චරිත ලක්ෂණ ගුත්තිල කාව්‍යයේ සුදුසු උදාහරණ ඇසුරින් සනාථ කිරීම ප්‍රමාණවත්ය.

5. බැද්දේගම නවකතාවෙහි උපයුක්ත කලාත්මක ලක්ෂණ නිසා එය පාඨක අවධානය දිනාගැනීමට සමත් වී තිබේ.

පාඨකයාගේ රුචිය වර්ධනය කිරීමට, කතාවේ නිර්මාණශීලීභාවය ඉහළ නැංවීම, තේමාව තියුණු ලෙස ඉදිරිපත් කිරීම වැනි අරමුණු මත පිහිටා ලේඛකයන් භාවිත කරන විවිධ රචනා ප්‍රයෝග කලාත්මක ලක්ෂණ ලෙසින් හැඳින්විය හැකිය. බැද්දේගම නවකතාව ආශ්‍රයෙන් එවන් කලාත්මක ප්‍රයෝග කිහිපයක් හඳුනා ගත හැකිය.

සං<u>කේත භා</u>විතය

වනය හා මී හරකා යන සංකේත යුගලය යොදා ගනිමින් කතුවරයා, යටත් විජිත සාහිත්‍ය දෘෂ්ටියට අනුගතව නොදියුණු අශිෂ්ට මානව සමාජයක් පිළිබඳ අදහස බැද්දේගම නවකතාවෙන් ප්‍රකට කරයි. වනයෙන් අශිෂ්ටත්වය ද ගම හා වනය අතර ගැටුමෙන් ශිෂ්ටත්වය හා අශිෂ්ටත්වය අතර පවතින අරගලය ද සංකේතවත් කරයි.

මෙම නවකතාවේ එන සිලිඳු තමන් වෙඩි කෑ මීහරකෙකුට සමාන කර සිතයි. මී හරකා යනු සිලිඳුගේ සංකේතය බව මතුපිටින් සලකා බැලුවහොත් පෙනෙයි. මී හරකා යනු පීඩිත සමාජ පන්තිය නියෝජනය කරන සංකේතයක් ලෙස හඳුන්වා දිය හැකිය.

අන්තර් පයීතත්වය

අන්තර් පයීතත්වය යනු මේ ආකාරයට වෙනත් පයීත ආශ්‍රයෙන් යම් පයීතයක් වඩා හොඳින් වටහා ගැනීමට ඉඩ සැපයීමයි. මෙය සරලව කතා දෙකක් අතර ඇතිවන සම්බන්ධයක් ලෙස ද සරලව විස්තර කළ හැකිය.
බැද්දේගම නවකතාවේදී ජාතක කතාවක් හා සම්බන්ධයක් ඇති කර තිබේ. උම්මග්ග ජාතකයේ අතුරු කතාවක් වන අමරා දේවියගේ පුවත ගැමි ගැහැනියක කියන කතාන්දරයක විලාසයෙන් නවකතාවට ඇතුළත් කර තිබේ. අමරා දේවිය පිළිබඳ කතාවෙන් පරමාදර්ශී ස්ත්‍රිය පිළිබඳ සාම්ප්‍රදායික මතය ද අවධාරණය වේ.
පුංචි මැණිකාගේ චරිතය අමරා දේවියගේ චරිතයට සමීප සම්මත හා පරමාදර්ශී චරිතයක් ලෙස සැලකිය හැකිය.
අමරා දේවියගේ කතාව ඇතුළත් කර ඇත්තේ පුන්චිරාළට එරෙහි වීම නිසා රෝගාතුර වූ සිලිඳු බෙරගමට යන ගමනේ අතරමැදටය. මෙම ගමන හින්නිහාමිගේ ජීවිතයේ සංක්‍රාන්ති අවස්ථාවකි. මේ අවස්ථාවේදි අමරා දේවියගේ පුවත ප්‍රවේශ කිරීමෙන් මෙම ස්ත්‍රී චරිත තුන අතර සම්බන්ධයක් ගොඩනැගෙන අතර ඒ චරිත එකිනෙක සැසඳීමට පාඨකයා පෙලඹෙයි.

නවකතාවක අර්ථමය පරාසය පුළුල් කිරීම සඳහා රූපක යොදා ගත හැකිය. රූපකයක දී බාහිරින් කැපී පෙනෙන සම්බන්ධයක් නැති වස්තු දෙකක් අතර කිසියම් සංකල්පමය සම්බන්ධයක් ගොඩනගයි. ව්‍යුහමය රූපකයේ දී එය වඩාත් පුළුල්ව සිදුවී අර්ථ තියුණු කිරීමට සමත් වේ. බැද්දේගම නවකතාවේ එන බැද්දේගම නමැති ගම්මානය ව්‍යුහමය රූපකයක් ලෙස ක්‍රියා කරන අතර එය කලාත්මක ප්‍රයෝගයකි. යටත්විජිතවාදීන් සිය යටත්විජිතවල ජනයා නොතකා හරිනු ලබන ආකාරයත් අතර යම් සමානකමක් ඇත. ඒ අනුව බැද්දේගම ගම්මානය යටත්විජිතවාදයේ හැසිරීම හඟවන ව්‍යුහමය රූපකයක් ලෙස ක්‍රියා කරයි.

මෙයට අමතරව බැද්දේගම නවකතාවේ කතා වස්තුව, චරිත නිරූපණය, පසුබිම හා පරිසරය, ආඛ්‍යාන ශෛලිය, ව්‍යුහය, ගැටුම, තේමාව, දෘෂ්ටිකෝණය ආදි කලාත්මක ලක්ෂණ එකිනෙකට සමබරව නිර්මාණය කර ඇති ආකාරය උදාහරණ සහිත ව දක්වා ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු පිරිනමන්න.

6.

- ❖ ගැමියා සතු යහපත් ගුණධර්ම උපාලිස් හා හඳයා අතර පවතින මානුෂීය සබඳතා ඇසුරින් ප්‍රකට වේ.
  "උපාලිස් තමා වෙතට ළං වූ ගොන්මාල්ලාගේ මුහුණ අත ගෑවේය."
  "ඌ තම ස්වාමියාගේ හිසත් අතත් ලෙව කෑවේය."

- ❖ ගැමි ජනජීවිතය චිත්‍රණය වන අයුරු
  " උපාලිස් උදයෙන්ම නැගී හඳයා තමාගේ කුඩු තිරික්කලයෙහි බැඳගෙන පොල් ඔය පාලම අසලට යයි "
  "ඔහු කඩවතට නොයන දවස්වලින් පසළොස්වක පෝයට හසුවන ඉරිදා දවසක් හැර අනික් ඉරිදා දවස්වල අඹරාව නැති බරබාගයක හඳයා බැඳ ඌ ලවා ගැමියන්ගේ පොල්ලෙලි ඇද්දූයේ ය. ඇතැම් විට හුනුගල් ඇද්දූයේ ය. "

- ❖ උපාලිස්ගේ නිවැසියන්ගේ හැසිරීම් රටා නිරූපණය
  ‘‘බොට පුන්නක්කු දෙන්න ආ නිසාද මගේ හැට්ටය තෙමුවේ? යි කියමින් ඈ හඳයාගේ කම්මුලට පහරක් ගැසුවා ය."

"හඳයා මෙයාට නිදාගන්නවත් දෙන්නේ නැහැ. හැමදාම උදේ ඇවිත් අවදි කරනවා" යි බිරිඳ කීවා ය.

❖ ගැමියන්ගේ ආත්මාර්ථකාමී ගති සොබා නිරූපණය.
"මම මේ මාසෙකින් හඳයගෙන් වැඩක් ගන්න හිතුවේ අදයි. තෙපානිස් සුමානෙකට දවස් දෙකක් තුනක් හඳයා බැඳගෙන ගොහින් පොල්ලෙලි අද්දනවා"..
"හඳයා උපාලිස්ගේ හරකා බව ගමේ කවුරුත් දන්නවා නෙව. දුප්පත් මිනිසුන් උගෙන් වැඩ ගත්තාම ඒකෙන් ලැබෙන පින උපාලිස්ට නෙව.."

සුදුසු උදාහරණ ඇසුරින් පිළිතුරු සැපයීම ප්‍රමාණවත්ය.

7.
සමාජ විෂමතාව ඉස්මතු කිරීමට නූතන කවීන් උත්සුක වී ඇති අයුරු ගුණදාස අමරසේකරගේ " අඳුර අපේ දුක නිවාවි" මොනිකා රුවන්පතිරණගේ " පොඩි දුව", නන්දන වීරසිංහගේ " ආදරණීය පාසල" යන කාව්‍ය නිර්මාණ ඇසුරෙන් උදාහරණ දක්වමින් පිළිතුරු සපයා තිබීම ප්‍රමාණවත්වේ.

8.
උපයුක්ත භාෂාවේ කාව්‍යාත්මකබව මුඛ්‍ය තේමාව සඳහා උචිත වී ඇති ආකාරය ‘පෙමතො ජායති සොකො’ නාට්‍ය ඇසුරෙන් පැහැදිලි කර තිබිය යුතුය.

ප්‍රේමයට අපූර්ව හා සනාතන අර්ථයක් ප්‍රවිෂ්ට කරවීම නිර්මාණකරුගේ අභිප්‍රායයි.
උදා :-
"ස්නේහ වූ කල මිනිස් කෙනෙකුට
අන්තයෙහි ඇති වන්නෙ දුකමයි
මිනිස් සිත නිති වෙනස් වන්නේ..."

ස්වර්ණතිලකා වීය ඇගෙ නම
ස්වර්ණවර්ණය ඇගේ දේහය
ස්වර්ණමාලා කලඹ සදිසි ය..."

"අර එන්නෙ ඒ දෙදෙන
මා කීව ඇත්ත මයි.
බලනු ඇගෙ මුහුණ දෙස
අනුරාගයෙන් දිලෙන..."

"සිසිල් අඳුනින් දෑස තවරන
මිහිරි වදනින් සවන් ගල්වන
අතීතය වත්මනට ගෙන එන"

"ඇත සිට පිරිනමන භක්තිය
ගෙනත් පාමුල තබන බුහුමන
ඒ එකක්වත් නොවේ සෙනෙහස
දිවා රෑ දෙක හද සමීපේ
දෑස නොපියා බලා ඉන්නා
දෙයකි සෙනෙහස.....".

යෝග්‍ය උදාහරණ දක්වමින් පිළිතුරු සැපයීම ප්‍රමාණවත්වේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025

71 - සිංහල

ලකුණු බෙදී යාම

II පත්‍රය - I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| **01.** | 2 | **11.** | 1 |
| **02.** | 4 | **12.** | 5 |
| **03.** | 3 | **13.** | 1 |
| **04.** | 5 | **14.** | 5 |
| **05.** | 2 | **15.** | 4 |
| **06.** | 1 | **16.** | 2 |
| **07.** | 3 | **17.** | 3 |
| **08.** | 5 | **18.** | 1 |
| **09.** | 4 | **19.** | 4 |
| **10.** | 3 | **20.** | 2 |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025

71 - සිංහල

ලකුණු දීමේ පටිපාටිය

II පත්‍රය - II කොටස

02. (අ)

(i) වර්තමාන ලෝකයෙහි සමාජය ශීඝ්‍රයෙන් වෙනස් වීම.

(ii)

- ❖ හැම මනුෂ්‍ය ක්‍රියාවලියක්, ප්‍රයත්නයක් හා විද්‍යා ශාස්ත්‍රයක් කෙරෙහිම දීර්ඝ කාලීන වශයෙන් බල පවත්වන ගැඹුරු පර්යේෂණ
- ❖ ගමනාගමන හා අදහස් හුවමාරු කරගැනීමේ වේගවත් ක්‍රම
- ❖ ජීවිතය සම්බන්ධ එදිනෙදා ප්‍රශ්න

(මින් දෙකක් ලියා තිබීම ප්‍රමාණවත් ය.)

(iii) පියාගේ දෘෂ්ටියට වඩා දරුවාගේ දෘෂ්ටිය පටුවීම.

(iv) ඇතැම් කරුණුවලට අවධානය යොමු කොට අන්‍ය කරුණු අමතක කිරීම.

(v) ජීවිතය පිළිබඳ සමතුලනතාවක් නොමැතිවීම.

(vi) වර්තමාන සමාජය ඉන්ද්‍රිය පිනවීම අවසාන පරමාර්ථය සේ සැලකීම.

(ලකුණු 02x6=12යි.)

(ආ)

- 19වන සියවසේ මුල හරියේ සිංහල භාෂාවේ සම්භවය ගැන විමර්ශන ආරම්භ විය.
- සිංහලය ඉන්දු - ආර්ය ගණයේ භාෂාවක් බව පිළිගැනුණි.
- මෙරට දේශීය පඬිවරුන් සතු මගද භාෂා සිංහලයේ මවුබස් ලෙස සැලකූහ.
- විදේශීය පඬිවරු ද ඉංග්‍රීසි උගත් ස්වදේශීය පඬිවරු ද මේ විමර්ශනයට යොමු වූහ.
- තුලනාත්මක හා ඓතිහාසික වාග් විද්‍යාවේ විද්‍යාත්මක ක්‍රම අනුව සිංහලය ඉන්දු - ආර්ය ගණයේ වෙනස් භාෂාවක් ලෙස විමර්ශනය කෙරිණි.
- ඇතැම් විමර්ශන ශාස්ත්‍රීය කරුණු වූ අතර ඇතැම් මතවාද අශාස්ත්‍රීය විය.

ඉහත කරුණු ඇතුළත්ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතුය. සාරාංශය එක් ඡේදයක් ලෙස ලියා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇත්නම්, සමස්තයෙන් ලකුණු දෙකක් අඩුවේ. වචන සංඛ්‍යාව 75-85 අතර තිබිය යුතුය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම්, වචන ප්‍රමාණයට නියමිත ලකුණු දෙකක් අඩු වේ.

| | | |
|---|---|---|
| සාරාංශයේ වචන ප්‍රමාණය | - | ලකුණු 02යි. |
| භාෂා නිරවද්‍යතාව | - | ලකුණු 03යි. |
| අන්තර්ගතය | - | ලකුණු 08යි. |

( මුළු ලකුණු 13යි.)

03. වචන සංඛ්‍යාව 300 – 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකිය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතුය.

I. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශිකරණය
II. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.
III. කරුණුවල පැහැදිලිබව.
IV. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම.
V. ව්‍යාකරණ දෝෂ රහිත වීම.
VI. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.
VII. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.
VIII. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම.

විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය. (මෙහිදී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් ලෙස රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකිය.

(ලකුණු 25යි.)

04. (අ)

(i) මිනිසුන් ශ්‍රමදානයෙහි නිරතවෙද්දී ගම්වැසියෝ තේ සැපයූහ.
(ii) ඕතොමෝ නිවේදිකාවක වුවද නිවසේ කටයුතු නොපිරිහෙළා ඉටු කළා ය.
(iii) අපි සියල්ලෝ ම ලක්වැසියෝ වෙමු.
(iv) ඥාති මිත්‍රාදීන් ප්‍රිය සාදයට පැමිණෙව්.
(v) දරුවනි, මේ පන්තියේ අනෙක් ළමයි කෝ?

(ලකුණු 01x5=5යි)

(ආ).

I. ආයතන කළමනාකරු විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා අපි කැඳවුණෙමු / කැඳවනු ලැබුවෙමු / කැඳවන ලදිමු / කැඳවන ලද්දෙමු / කැඳවනු ලැබීමු.
II. පොලිසිය විසින් සිද්ධියට අදාළ සැකකරුවෙක් අත් අඩංගුවට ගැනිණි / ගනු ලැබිණි / ගනු ලැබීය / ගන්නා ලද්දේය / ගනු ලැබුවේය.
III. නගර සභා සේවකයන් විසින් දිරූ ගස කපා ඉවත් කරනු ලැබේ / ලබයි / ඉවත් කෙරේ / කෙරෙයි / කැරේ / කැරෙයි.
IV. විදුහල්පතිවරයා විසින් ගුරුතුමිය ද ශිෂ්‍යාවෝ ද ප්‍රශංසාවට ලක් කරන ලදහ / ලද්දෝය / කරනු ලැබූහ / ලැබුවෝ ය / ලක් කෙරුණු / කෙරුණහ.
V. රජය විසින් නිලධාරීන් ලවා සත්ත්ව සංගණනයක් කරවනු ලැබීය / කරවන ලදි / කරවන ලද්දේය / කැරවිණි.

(ලකුණු 01x5=5යි)

(ඉ)

I. සියල්ලන්ම, එති.

II. නාහිමියන්, පිළිගැන්වී ය.

III. විශාරදකයෙකු, විචාරකයෙක්

IV. මම, කැමැත්තෙමි.

V. නායකයෝ, වෙත්.

(ලකුණු 01x5=5යි)

5.

| | වචනය | ව්‍යාකරණ අංගය | ව්‍යාකරණ අනු අංගය |
|---|---|---|---|
| I. | මව්පියෝ | සමාස | දකාරාර්ථ සමාස / ද අරුත් සමාස |
| | දරුවන්ගේ | විභක්ති | සම්බන්ධ විභක්ති / සබඳ විභක්ති |
| | කෞශල්‍ය | තද්ධිත | භාවාර්ථ තද්ධිත |
| II. | මහාධිකරණ | සන්ධි | සමාන ස්වර දීර්ඝ සන්ධිය / ස්වරාදේශ |
| | විසින් | නිපාත | විභක්ත්‍යර්ථයේ නිපාත |
| | ඉල්ලීම | කෘදන්ත | භාව කාරක කෘදන්ත |
| III. | ප්‍රවීණ | විශේෂණ | නාම විශේෂණ |
| | ආධුනික | තද්ධිත | සම්බන්ධාර්ථයේ තද්ධිත |
| | අමතා | ක්‍රියා | පූර්ව ක්‍රියා |
| IV. | සියලු | නාම පද | සර්ව නාම |
| | යෙහෙන් | විශේෂණ | ක්‍රියා විශේෂණ |
| | කරත්වා | ක්‍රියා | ආශිර්වාද ක්‍රියා / ප්‍රාර්ථනා ක්‍රියා |
| V. | නියං සමයේ | සන්ධි | ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය |
| | යන | කෘදන්ත | වර්තමාන කෘදන්ත |
| | වැව්පොකුණු | සමාස | දකාරාර්ථ සමාස |

(ලකුණු ( 01x3 ) x 5 = 15යි.)

6. (අ)

I. සුබ

II. පවන

III. හස්ති

IV. සුළඟ

V. ශුභ

VI. ඇත්

(ලකුණු ½ x6 = 03යි.)

(ආ)

i. උසසුන්
ii. කටැටි
iii. වැම්මල්
iv. සාධුක්ති
v. නිරුදක
vi. හෙළිල්ලඹු

(ලකුණු ½ x6 = 03යි.)

(ඉ)

රජදරුවෝ - ප්‍රථමා විභක්ති / පෙර විබත
පණ - කර්ම විභක්ති / කම් විබත

මිනිසුනි - ආලපන විභක්ති / අලප් විබත
දුසිරිතෙන් - අවධි විභක්ති / අවදි විබත

වත්තෙහි - ආධාර විභක්ති / අදර විබත
පැළවලට - සම්ප්‍රදාන /සපදන් විබත

(ලකුණු ½ x6 = 03යි.)

(ඊ).

දුටුගැමුණු (දුට්ඨ ගාමිණී අභය) නරේන්ද්‍රයා සතුරු බළ මුළු පරදා, රට එක්සේසත් කොට, " මම මහා සෑය තනවමි" යි යන අදිටනින් ඊට සුදුසු භූමිය විමසන කල්හි ඒ ස්ථානයේ රන් තෙලඹු ගසට අධිගෘහිත දේවතාවිය වූ ස්වර්ණමාලිය තම විමන නොනසන ලෙස අයැද සිටි විට " අහෝ! දේවතාවිය, ඔබට අන් තැනක් සකසා දෙමි. මේ සත්කාර්ය ඉවසාලන්නැයි කියා ථූපය ඉදි කොට ප්‍රතිඥා පරිදි ඇගේ නමින් ´ස්වර්ණමාලි´ ලෙස මහා සෑය නම් කළේ ය.

(ලකුණු ½ x6 = 03යි.)

(උ).

(i) එකමුතුකමින් ක්‍රීඩා කළ නිසා තමන් තරගය ජය ගත් බව ජයග්‍රාහී පිලේ නායකයා මාධ්‍ය හමුවේ කීය.
(ii) විදුහල්පතිතුමිය සිසුවියන් අමතා ඔවුන් පාසලේ ගෞරවය ආරක්ෂා කළ යුතු බව පැවසුවා ය.
(iii) ඔහු අනාගත අභියෝග හමුවේ නොසැලී සිටිය යුතු බව දේශකයා ප්‍රකාශ කළේ ය.

(ලකුණු 01x3=3යි.)

07.

(i) අත්දැකීම්, ඔවුන්ගේ, ග්‍රන්ථයන්හි, තර්කයෙහි, වර්තමාන, සමකාලීන, ස්පර්ශනීය
(ii) මානුෂික, කෘෂිකාර්මික, මූලික, පාරම්පරික
(iii) අනුබද්ධ, සංකීර්ණ, සම්මර්ශන
(iv) සහේතුකතාවත් - කොම්බුව සහ දීර්ඝත්ව ලක්ෂණය
කෙටි පාපිල්ල
ඇලපිල්ල

කවියකුගේ - කෙටි ඉස්පිල්ල
කෙටි පාපිල්ල
කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය
ආකෘතිය - ගැටය සහිත ඇලපිල්ල
කෙටි ඉස්පිල්ල
(v) විදග්ධ, අනුබද්ධ, භූමි, මධ්‍යකාලීන, භාෂාමය

(ලකුණු 03x5= 15යි.)

8.

(i) මිශ්‍ර ක්‍රියාව

අවසාන ක්‍රියාව සමග සිදුවන ක්‍රියාව මිශ්‍ර ක්‍රියාව යි. ධාතු ප්‍රකෘතියෙන් පරව මින්, මින, මිනි, ප්‍රත්‍යය යෙදී මේ ක්‍රියා සෑදේ.

මින් - නටමින්, වඳිමින්, දකිමින්

මින - තබමින, සොයමින, නරඹමින

මිනි - ගුමමිනි, විදමිනි, බලවමිනි.

- පූර්ව ක්‍රියාව ද්විත්ව වීමෙන් ද මිශ්‍ර ක්‍රියා සෑදේ.
  උදා:- හඬ හඬා, වැටි වැටී, බල බලා, හැපි හැපී

මිශ්‍ර ක්‍රියා සහිත වාක්‍ය

a. ගායකයා ගී **ගයමින්** නටයි.
b. වසු පැටියා **හඬ හඬා** වේගයෙන් දිව්වේ ය.
c. පුදමින් එසුරවර සිරි සරණ **වඳිමින.**

(ii) අවධි විභක්තිය

ක්‍රියාවක් සිදුවීමේ සීමාව දැක්වෙන්නේ අවධි විභක්තියෙනි. මේ සඳහා ඉන්, එක්, ගෙන්, වලින් ආදි ප්‍රත්‍යය හා නිපාත යෙදේ.

උදා :- කුරුලු පැටවු **කූඩුවෙන්** පිටවූහ.

මගියා **දුම්රියෙන්** බැස්සේය.

අපි **ගඟින්** එතෙර වීමු.

**වැව්වලින්** ජලය නිකුත් කෙරේ.

තෙක්, දක්වා, තුරු, පටන් යන නිපාත හා බැඳි පද අවධි විභක්ති ගනී.

(iii) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

පෙර පදයේ අග ඇති සඤ්ඤක අක්ෂරයෙහි ඇතුළත් ගාත්‍රාක්ෂරය හා ස්වරය ලොප් කොට ඉතිරි වන සඤ්ඤකය පූර්ණ නාසික්‍යයක් ලෙස ගැළපීම ගාත්‍රාක්ෂර ලෝප සන්ධියයි.

උදා :- මුඟු + ඇට

මු+ 0 (ග්+උ) + ඇට

මුං+ ඇට

මුංඇට

මිහිඳු + තලා

මිහි + 0+(ද්+උ) තලා

මිහි + 0 + තලා

මිහින්තලා

ගඟ + පොළ = ගම්පොළ

වඟු + මුතු = වම්මුතු

කොළඹ + පුර = කොළොම්පුර

(iv) ගෞරවාර්ථයේ තද්ධිත ප්‍රත්‍යය

´ගරු කටයුතු´ අර්ථයෙහි යෙදෙන තද්ධිත ප්‍රත්‍යය ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය නම් වේ. මෙයට ආණ, අණි, අණු ප්‍රත්‍යය යෙදේ.

උදා :- ආණ - පිය + ආණ - පියාණ

සිටු + ආණ - සිටාණ

පුත් + අණු - පුතණු

තෙර + අණු - තෙරණු

දූ + අණි - දියණි

මා + අණි - මැණි

❖ ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය යෙදී සෑදුණු නාමපද උක්ත වූ කල්හි ආඛ්‍යාතය බහුවචනයෙන් තැබේ.

උදා :- **බමුණාණෝ** බුදුන්ට දනට ආරාධනා **කළහ**.

**පුතණුවෝ** මව්පියන්ට උපස්ථාන **කරති.**

**මිත්තණියෝ** මිණිපිරියට කතා කියා **දෙති.**

(v) උපමා පූර්ව පද විශේෂණ සමාස

විශේෂණය උපමානයක් ලෙස මුල් පදය ලෙස යෙදී සෑදෙන සමාසයයි.

උදා :- මුතු අකුරු (මුතු වැනි අකුරු)

ලිය කොමල (ලිය වැනි කොමල)

සඳ වත (සඳ වැනි වත)

තිසර තන (තිසර වන් තන)

මල් හිනා (මල් වැනි හිනා)

(ලකුණු 05x3= 15යි. )